වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩුව

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පහත දැක්වෙන පුරප්පාඩුව පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් කාර්යශීලී, උද්‍යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ - විශ්ලේෂණ සේවා තනතුර - (HM 1-1)

### රැකියා පිරිවිතරය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය විශ්ලේෂණ රසායනාගාරයේ ක්‍රියාත්මක වන නියැදිකරණ හා පරීක්ෂා කිරීම් ඒකකය, ක්ෂුද්‍ර ජීව පර්යේෂණ රසායනාගාරය, රසායන විශ්ලේෂණ රසායනාගාරය හා පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ රසායනාගාරය මගින් තේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ට සේවා සැපයීමේ කටයුතු ඉටු කිරීම. විශ්ලේෂණ රසායනාගාරයේ සාමාන්‍ය පර්පාලන කටයුතු ඉටුකිරීම. දේශීය හා විදේශීය වශයෙන් පිළිගත් තත්ව සහතික නිකුත් කිරීම සඳහා තත්කාලීණව අනුමත කර ඇති නිර්ණායක අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය පවත්වාගෙන යාම.

### අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

**බාහිර අයදුම්කරුවන් (අ හෝ ආ ඛාණ්ඩය)**

(අ ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් රසායන විද්‍යාව හෝ ක්ෂුද්‍ර ජීව විද්‍යාව හෝ විෂයක් ලෙස ඇතුලත්ව හදාරා ලබාගත් ප්‍රථම විද්‍යා උපාධිය

සහ

රසායන විද්‍යාව හෝ ක්ෂද්‍ර ජීව විද්‍යාව හෝ යන විෂයන් එකක් සම්බන්ධයෙන් අවම වශයෙන් පශ්චාත් උපාධියක් ලබාතිබීම

සහ

ප්‍රථම උපාධි සුදුසුකම ලැබීමෙන් අනතුරුව අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් **අවුරුදු 15 ක** කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම හා ඉන් අවම වශයෙන් වසර 05 ක කාලයක් පිළිගත් විශ්ලේෂණ හෝ ක්ෂුද්‍රජීව රසායනාගාරයක කළමනාකරණ තනතුරක සේවය කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (අ හෝ ආ ඛාණ්ඩය)**

(අ) උක්ත බාහිර ඛාණ්ඩය යටතේ දක්වා ඇති සුදුසුකම සපුරා තිබීම.

හෝ

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි විශ්ලේෂණ රසායනාගාරයෙහි මධ්‍යම කළමනාකරණ (MM) 1 ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**වැටුප් පරිමාණයඃ HM 1 - 1 02/2016 රු.80,295 - රු. 2,270 × 15 - රු.114,345**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 හි ප්‍රතිපාදන අනුව **රු. 80,295/-** ආරම්භක මාසික වැටුප මත පිහිටුවා එම වැටුපද එයට අමතරව මාසිකව **රු.7,800/-** ජීවන වියදම් දීමනාවද චක්‍රලේඛ ප්‍රකාරව වෘත්තීය දීමනාවද ගෙවනු ලැබේ. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 අනුව ඉන්ධන දීමනාව සහිතව මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන රියැදුරෙකු සහිත වාහනයක් අනුයුක්ත කිරීමට හෝ ප්‍රවාහන දීමනාව ගෙවීමට කටයුතු කරනු ලැබේ.

**වයස් සීමාවඃ**

**අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.** අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

### වෙනත් ප්‍රතිලාභඃ

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

### පොදු කොන්දේසි

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාල වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ඇත.

### අයදුම් කිරීම

රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **http://www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග **2022 නොවැම්බර් 29** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **අයදුම්කරන තනතුර** සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**
574, ගාලු පාර,
කොළඹ 3.